## පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණයේ කළමනාකරණ භාරය -2012

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණයේ කළමනාකරණ භාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථාවර තැන්පතු

(i) ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.919,407 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් වර්ෂයේ ඌණතාවයද ඒ හා සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) පොළී ආදායම ගිණුම්ගත කිරිමේදී ඊට අදාල රු.693,251 ක රඳවාගැනීමේ බදු ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) ආපනශාලාවට ලබාදී තිබුණු රු.7,068,905 ක් වටිනා මුළුතැන්ගෙයි උපකරණ මූල්‍ය ප්‍රකාශනවලින් අතහැරී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ රු. 771,049 ක් වැයකර ඉදිකර තිබූ අපද්‍රව්‍ය ටැංකිය වර්ෂය තුළදී භාවිතයෙන් ඉවත් කර තිබුණද එය ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.2 අවිනිශ්චිත ගිණුම්

අවිනිශ්චිත කුළී ආදායම් රු.349,000 ක් හා අවිනිශ්චිත තැන්පතු ශේෂ රු.6,550,000 ක් මූල්‍ය ප්‍රකාශන තුළ වෙනම හෙළිදරව් කිරීමට හා නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ලැබිය යුතු කුළී ආදායමෙන් රු.7,510,500 ක් හෙවත් සියයට 16 ක් හා ලංකා ධීවර සංස්ථාවෙන් ලැබිය යුතු ශේෂයෙන් රු.9,229,020 ක් හෙවත් සියයට 64 ක් වසරකට වැඩි කාලයක සිට පරිශේෂව පැවතුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.56,106,502 ක් වූ ණය හිමියන් හා අනෙකුත් වගකීම් සහ ලංකා ධීවර සංස්ථාවෙන් ලැබිය යුතු රු.14,529,380 ක් සඳහා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කර නොතිබුණි.

## 1.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති යනාදියට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | කළමනාකරණ භාරයේ ව්‍යවස්ථාව | |
| | (i) 8(අ) ඡේදය | කළමනාකරණ භාර රැස්වීම් යටත් පිරිසෙන් දෙමසකට වරක්වත් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා රැස්වීම් 04 ක් පමණක් පවත්වා තිබුණි. |
| | (ii)10 (ආ),(ඇ) ඡේද | මූල්‍ය ප්‍රකාශනවල පිටපත් භාණ්ඩාගාර ලේකම්, මුදල් අමාත්‍යවරයා සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා වෙත යැවිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි - 756 හා 757 | 2012 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදුකර වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කරන ලද්දේ 2014 අගෝස්තු 15 දිනදීය. |
| (ඇ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත 2 වගන්තිය | "භාරය" ආදායම් බදු බැඳියාවට යටත් පුද්ගලයෙකු වූවද ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2006 ජනවාරි 25 දිනැති අංක 8 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛය - මාර්ගෝපදේශ සංග්‍රහය - 3.2 | මිල ගණන් කැඳවා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව වෙළඳ සංකීර්ණ පරිශ්‍රයේ පිරිසිදු කිරීමේ සේවාව සඳහා ආයතනයක් තෝරාගෙන තිබූ අතර එම ආයතනය සමඟ 2012 පෙබරවාරි 14 දින සිට වර්ෂ 5 ක් තරම් වන දීර්ඝ කාලසීමාවක් සඳහා ගිවිසුමකට ඇතුළත් වී තිබුණි. |
| (ඉ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක PE/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 04.1 ඡේදය | භාරයේ වාර්ෂික අයවැය ලේඛනය පෙර වර්ෂයේ සැප්තැම්බර් 15 ට පෙර අදාල ඇමතිවරයාගේ අනුමැතිය ලබාගෙන සැප්තැම්බර් 30 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 1.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

රාජකාරී ආවරණය කිරීම සඳහා පත්කරනු ලැබ තිබුණු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ සැලසුම් සහකාරවරියකට ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12.2.5 උප

වගන්තියට පටහැනිව 2011 වසරේ මාස 9.5 ක් සඳහා රු.212,500 ක දීමනාවක් ගෙවා තිබුණි. 2011 දෙසැම්බර් මස එම තනතුරේ රාජකාරි අදාල නිලධාරිණියගේ රාජකාරී ලැයිස්තුවට ඇතුළත් කිරීමෙන් පසු එම සාමාන්‍ය රාජකාරී ඉටුකිරිම වෙනුවෙන් මාස 12.5 ක් සඳහා රු.287,500 ක්ද මෙම නිළධාරිණියට දීමනා ලෙස ගෙවා තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා භාරයේ මූල්‍ය ප්‍රතිඵලය රු.863,735 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.34,941,614 ක් විය. ඒ අනුව අරමුදලේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.34,077,879 ක වර්ධනයක් දක්නට ලැබුණි. කුළී ආදායම් හා ස්ථාවර තැන්පත් පොළී ආදායම් වැඩිවීම මෙම වර්ධනයට හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

වෙළඳ සංකීර්ණය පිහිටුවීමට අවශ්‍යකරන වත්කම් හා යටිතල පහසුකම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රජය විසින් දරා තිබුණු වියදම රු.2,030,406,385 ක් වූ අතර භාරය පිහිටුවීමේ පරමාර්ථ හා කාර්යයන් වන්නේ වෙළඳ සංකීර්ණයේ පූර්ණ පාලනය සහ කළමනාකරණය භාර ගැනීම, එකී සංකිර්ණය කාර්යක්ෂම ලෙස මෙහෙයවීම, කළමනාකරණය කිරීම සහ පවත්වාගෙන යාම හා ඊට අනුෂංගික කාරණා ගැන කටයුතු කිරීමයි. ඊට අදාල වගකිම් රාශියක් භාරයට පැවරී ඇති අතර භාරයේ සියළු ආදායම් නිසිපරිදි අයකර ගැනීමත් වියදම් මනාලෙස කළමනාකරණය කරගැනිමත් සිදුවිය යුතු වුවත් එම කාර්යයන් නිසිපරිදි ඉටුකිරීමට භාරය අසමත්ව ඇති බව පහත සඳහන් කරුණු අනුව නිරික්ෂණය විය.

(අ) රථ වාහන අංගනයේ ආදායම් අක්‍රමවත් වීම

(i) වෙළඳ සංකීර්ණ පරිශ්‍රයේ රථ වාහන අංගනයේ ආදායම් එකතු කිරිමේ කටයුතු භාරය විසින් ලංකා ධීවර සංස්ථාව වෙත පවරා තිබූ අතර සංස්ථාව එම කාර්ය සඳහා තෙවන පාර්ශවයක් වූ සමාගමක් සමඟ භාරයේ අනුමැතියකින් තොරව ගිවිසුමකට එළඹ තිබුණි.

(ii) ගිවිසුම සඳහා නීතිපතිවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iii) සමාගම විසින් එකතු කරගනු ලබන ආදායමෙන් අඩුකළ හැකි වියදම් මොනවාද යන්න ගිවිසුමට ඇතුළත් වී නොතිබූ අතර භාරයට ආදායම් ප්‍රේෂණය කිරීමේදී සේවක වැටුප් රු.1,721,802 කින්ද අනෙකුත් වියදම් රු.1,827,990 කින්ද වැඩිපුර අවකරණය කරගෙන තිබීම හේතුවෙන් භාරයට අහිමිවී තිබූ ආදායම පිළිවෙලින් රු.516,548 ක් හා රු.548,397 ක් විය.

(iv) සමාගමේ 2011/2012 හා 2012/2013 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන පිටපත් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.5,295,360 ක් වූ කළමනාකරණ භාරයේ රථවාහන ගාල් කිරීමේ ආදායමේ නිරවද්‍යතාවය විගණනයට තහවුරු කර ගත නොහැකි වූ අතර වෙළඳ සංකීර්ණයේ පවත්වාගෙන ගොස් තිබූ පොත්පත් අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.39,636 ක් අඩුවෙන් භාරයට අයවී තිබුණි.

(v) වෙළඳ සංකීර්ණ පරිශ්‍රයේ රථ වාහන අංගනය දෛනිකව පරිහරණය කරන ව්‍යාපාරිකයින් සඳහා නිකුත් කරනු ලබන සාමාජික කාඩ්පත් ගාස්තු සමාලෝචිත වර්ෂය සඳහා අඩුවෙන් අයකිරීම හේතුවෙන් ආදායම රු.2,989,080 ක් අඩුවෙන් භාරයට අයවී තිබුණි.

(vi) 2011 හා 2012 වර්ෂවලට අදාලව සමාගම අයකර ගෙන ලංකා ධීවර සංස්ථාවට ප්‍රේෂණය කරනු ලබන ආදායමෙන් භාරයට අයවිය යුතු රු. 14,529,376 ක් ධීවර සංස්ථාව වෙතින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) වෙළඳසැල්වල කුලී ආදායම විධිමත්ව අයනොවීම

(i) වෙළඳසැල් 128 කින් යුතුව ඉදිකර තිබූ සිල්ලර වෙළඳ සංකීර්ණයේ වෙළඳසැල් 64 ක් 2011 හා 2012 වර්ෂවලදි රු.9,625,540 ක් වැයකර තොග වෙළඳසැල් බවට පත් කර තිබුණද, විගණිත දින වූ 2014 අගෝස්තු 31 වන විට මෙම වෙළඳසැල් 64 හා සිල්ලර වෙළඳසැල් වශයෙන් පවතින වෙළඳසැල් 64 න් වෙළඳසැල් 35 ක් භාවිතා නොකිරීම හේතුවෙන් ඒවායේ කුලී ආදායම භාරයට අහිමිවී තිබුණි.

(ii) සිල්ලර වෙළඳ සංකිර්ණ ගොඩනැඟිල්ලේ කුළියට දීම සඳහා ඉදිකර තිබූ මාසික තක්සේරු වටිනාකම රු.14,000 බැගින් වූ වෙළඳ සැල් කුටි 16 න් කුටි 02 ක් පොලිස් නිලධාරීන්ගේ පරිහරණය සඳහාද එක් කුටියක් ආපන ශාලා සේවකයින්ගේ පරිහරණය සඳහාද ගාස්තු අයකිරීමෙන් තොරව ලබාදී තිබුණි.

(ඈ) වෙළඳ සංකීර්ණයේ පරිශ්‍රය තුළ පිහිටි ගොඩනැගිලි කීපයක අත්තිවාරම් වල කොන්ක්‍රීට් තට්ටුවට යටින් පොළව ගිලා බැස ජලය පිරී තිබූ අතර පරිශ්‍ර භූමිය හා මාර්ග වල තැනින් තැනද ගිලා බැස අපවිත්‍ර ජලය පිරී තිබුණි. ඒවා යථාතත්වයට පත් කිරීමට 2014 අගෝස්තු 31 දින දක්වා පියවර ගෙන නොතිබුණි.

(ඈ) කළමනාකරණ භාරයේ සේවයේ නියුතුව සිටි නිලධාරිණියක අනුමැතිය රහිතව ලබාගත් නිවාඩු දින 50 ක් වැටුප් රහිත නිවාඩු ලෙස සලකා වැටුපෙන් අයකර ගැනීමට හා විනය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

## 3.2 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

**(අ) අපද්‍රව්‍ය ටැංකියක් ඉදිකිරිම**

වෙළඳ සංකීර්ණයේ ඉවත දමන අපද්‍රව්‍ය වියළා කුඩුකොට අළෙවි කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් විසින් ඔවුන්ගේ වියදමින් යන්ත්‍රාගාරවලින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකර තිබූ අතර ඒ සඳහා භාර මණ්ඩලයේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

**(ආ) ආපන ශාලාව බදු දිම**

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ අංක 3.2 ට පටහැනිව ආපන ශාලාව 2011 අප්‍රේල් 01 දින සිට වසර 10 ක කාලයක් සඳහා රු.129,000 ක මාසික කුලියකට බදු දී තිබුණි.

(ii) 2011 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු වටිනාකම රු.1,143,868 ක් වූ ශීතකරණ 03 ක් භාවිතයට ගැනීමෙන් තොරව ආපන ශාලාව තුළ පැවතුණි.

**(ඇ) මසුන් කැපීමේ කුටි ඉදිකර බද්දට දීම**

(i) වෙළඳ සංකීර්ණයේ මසුන් කැපීමේ කුටි 48 ක් රු.4,800,000 ක වියදමින් ඉදිකිරිමට සැලසුම් කර තිබුණද රු.4,092,792 ක වියදමක් දරා ඉදිකර තිබුණේ කුටි 44 ක් පමණි. ඊට අදාල ගෙවීම් කිරීමේදි මැනුම් පත්‍රිකා පරීක්ෂා කරන ලද බවට සාක්ෂි හෝ ඉංජිනේරුවරයාගේ නිර්දේශයේ මුල් පිටපත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) මෙම කුටි රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව පුද්ගලයින් 44 දෙනෙකුට 2012 මාර්තු සිට බදුදී තිබු අතර එකී බදුකරුවන් සමඟ කළමනාකරණ භාරය විසින් බදු ගිවිසුම් වලටද එළඹ නොතිබුණි.

**3.3 දෘශ්‍ය අක්‍රමිකතා**

**(අ) ආරක්ෂක සේවාව සඳහා සාවද්‍ය ගෙවීම් - 2011,2012 සහ 2013**

(i) වෙළඳ සංකීර්ණයට ආරක්ෂාවට සපයනු ලබන පෞද්ගලික ආරක්ෂක සේවා සමාගම ආරක්ෂක කටයුතු සඳහා එක් සේවා මුරයකට ආරක්ෂක නිලධාරීන් 9-12 අතර ප්‍රමාණයක් යොදවමින් නිළධාරීන් 24 ක් යෙදවූ බවට සඳහන් කර ඉදිරිපත් කරතිබූ බිල්පත් සඳහා භාරය ගෙවීම් කර තිබුණි. මේ අනුව 2011 ජූනි 01 සිට 2013 ඔක්තෝබර් 31 දක්වා කාලය තුළ සාවද්‍ය ලෙස වැඩිපුර ගෙවා තිබූ මුදල රු. 15,399,050 ක් වූ අතර ඊට අමතරව වැඩිපුර ගෙවූ මුදලට එකතුකල අගය මත බද්ද (VAT) ලෙස රු. 1,884,954 ක් හා ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) ලෙස රු. 307,999 ක්ද එකී සමාගමට වැඩිපුර ගෙවා තිබුණි.

(ii) ඉහත ගෙවීම් කිරීමේදී නිසි සැලකිල්ලෙන් තොරව කටයුතු කළ භාරයේ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට හා වැඩිපුර ගෙවූ මුදල් ආරක්ෂක සේවා සමාගමෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වූවද 2014 අගෝස්තු 31 දක්වා ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(iii) 2011 මාර්තු 31 සිට 2015 මාර්තු 30 දක්වා වසර 4 ක කාලයක් ආවරණය වන පරිදි 2014 ජනවාරි 08 දින මෙම ආරක්ෂක සේවා සමාගම සමඟ භාරය ගිවිසුමකට එළඹ තිබූ අතර වෙළඳ සංකිර්ණ පරිශ්‍රයට ආරක්ෂක නිලධාරීන් යෙදවිය යුතු ස්ථාන හා නිලධාරී සංඛ්‍යාව කලින් තීරණය කර ඒ පිළිබඳ කොන්දේසි එකී ගිවිසුමට ඇතුළත් කර ද නොතිබුණි.

**3.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

වෙළඳ සංකීර්ණයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා ලංකා ධීවර සංස්ථාවෙන් 41 ක කාර්ය මණ්ඩලයක් යොදවා තිබුණ ද භාරයේ කාර්ය මණ්ඩල අවශ්‍යතාවය තීරණය කර කාර්යමණ්ඩලය අනුමත කරවා ගැනීමට හා සංවිධාන සටහනක් සකස් කිරීමට ක්‍රියා කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2006 දෙසැම්බර් 22 දිනැති පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 2 ක් ඇතුළත අරමුදලේ මූල්‍ය වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් 2012 මුදල් වර්ෂය සඳහා කළමනාකරණ භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කරන ලද්දේ මාස 15 කට පසුව 2014 මැයි 30 දින ය.

**4.2 සංයුක්ත සැලැස්ම**

භාරය සඳහා සමාලෝචිත වර්ෂය හා ඉදිරි වර්ෂ ඇතුළත් වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින් වර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය

(ආ) අයවැය පාලනය හා ගිණුම්කරණය

(ඇ) ආදායම් රැස් කිරීම